# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 13,241 — 1962 අගෝස්තු 3 වැනි සිකුරාදා — 1962.8.3**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 1137 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 1138 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 1139 |
| රෙජිස්ට්‍රාර්වරුන් ගේ පත් කිරීම් ආදිය ... ... | — |

| | පිට |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1140 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත් කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1141 |
| "සුරාබද්ද ආඥපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 311**

අංකය : සී/වීඑජ්/42

### යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද මාරුකිරීමක්

ලංකා ස්වේච්ඡා හට සේනාවේ පොදු උප සේවයේ නියුක්ත පහත නම් සඳහන් නිලධාරියා, 1962 ජූනි 20 වැනි දින සිට, ලංකා යුද හමුදා සේවා බලකායේ 2 වැනි (ස්වේච්ඡා) කණ්ඩායමට මාරු කරන ලදී:—

කපිතාන් පතිරෙනහලාගේ දොන් සොලමන් රාජපක්ෂ, ඊ. ඩී.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කිව් දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජූලි 28 වෙනිදා,
කොළඹ දීය.
8-233/1

**1962 අංක 312**

අංකය : සී/වීඑජ්/42.

### යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද මාරුකිරීම්

ලංකා ස්වේච්ඡා හට සේනාවේ, පොදු උප සේවයෙහි නියුක්ත පහත නම් සඳහන් නිලධාරීන් 1962 ජූනි 20 දින සිට පහත දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා අනු පිළිවෙලට ලංකා ජාතික ආරක්ෂක බලකායට මාරු කරන ලදී:—

තාවකාලික මේජර් සිසිල් පෙඩ්රික් ඈනස්ලි ජොන්ක්ලස්,
කපිතාන් පර්සි ආතර් ගුරුසිංහ,
තාවකාලික කපිතාන් චින්නයියා රාජතුරෙයි,
ලුතිනන් වර්නන් සාලිය වෙදසිංහ,
ලුතිනන් මාණික්කම් රාජේන්තිරම්,
ලුතිනන් ඒලියන් ඉයුස්ටස් ජයසේකර,
උප ලුතිනන් ලයනල් සිරිනාත් දිසානායක,

### විශෙෂ නිවේදනයයි

1962 අගෝස්තු මස 14 වෙනි අඟහරුවාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1962 අගෝස්තු 17 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1962 අගෝස්තු 11 වැනි සෙනසුරාදා දවල් 12ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1962 අගෝස්තු 3 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

උප ලුතිනන් නෝමන් එඩ්වර්ඩ් වීරසූරිය,
උප ලුතිනන් වල්පොල මුදලිගේ ගැමුණු විජය විජේරත්න,
උප ලුතිනන් කුඩා බණ්ඩාර වර්ණසූරිය.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කිවු. දියෙස්,
රාජ්‍ය-ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 ජූලි 28 වෙනිදා,
කොළඹ දීය.

8 233/2

---

1962 අංක 313

අංකය : ඩී. 32/රෙක්ව්.

## රාජකීය ලංකා නාවික හමුදුව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

1962 අප්‍රේල් 23 වැනි දින සිට, ලයිතන් කොමාන්ඩර් පදවියට :—
ලයිතන් ඩී. බී. ගුණසේකර, රාජකීය ලංකා නාවික හමුදාව.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කපු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1962 ජූලි 23 වෙනිදා,
කොළඹ දී ය.

8-136/1

---

1962 අංක 314

අංකය : ඩී. 32/රෙක්ව්.

## රාජකීය ලංකා නාවික හමුදුව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

1962 මැයි මස 23 වැනි දින සිට, ලයිතන් කොමාන්ඩර් පදවියට :—
ලයිතන් ඒ. ඩබ්ලිව්. එච්. පෙරේරා, රාජකීය ලංකා නාවික හමුදාව.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කපු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1962 ජූලි 23 වෙනිදා,
කොළඹ දී ය.

8-136/2

---

1962 අංක 315

අංකය : ඩී. 22/රෙක්ව්/42.

## රාජකීය ලංකා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

1962 අගෝස්තු මස 1 වැනි දින සිට, රාජකීය ලංකා නාවික හමුදාවේ නිත්‍ය සේවයෙන් ලුතිනන් කේ. ජේ. ආර්. සර්පන්ච් විශ්‍රාම ගනී.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කපු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 ජූලි 31 වෙනිදා,
කොළඹ දී ය.

8-264

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 316

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඒ. 11/48.

ඕ. එල්. ද ක්‍රෙට්සර් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 ජූලි 21 වැනි දින සිට, කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක 8251/එල්. දරණ නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට හා 1962 ජූලි 24 වැනි දින සිට, කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක 8790/එල් හා 798/ඉසෙඩ්එල් දරණ නඩුවල තීන්දු දීමට, කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑස්. සී/පී. පී. 7/62.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන මහතා වෙනත් රාජකාරිවල යෙදී සිටින අතර, පී. ඒ. ද එස්. සේනාරත්න මහතා 1962 ජූලි 25 වැනි දින සිට, ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, හෝ නැවත නියමයක් කරනතුරු, කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයේ වැඩ බැලීමට.

අංකය : ජේඒ. 37/48.

ජේ. ජේ. එෆ්. ඒ. ඩයස් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 ජූලි 25 වැනි දින සිට, කුරුණෑගල මහෙස්ත්‍රාත් උසාවියේ අංක. 7852 දරණ නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, කුරුණෑගල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා කුරුණෑගල, අතිරේක, දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 2/56 (III).

එස්. ඩී. ජයසුන්දර මහතා වෙනත් රාජකාරිවල යෙදී සිටින අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ජේකනාදන් මහතා 1962 ජූලි 17 වැනි දින සිට 1962 අගෝස්තු 4 වැනි දින දක්වා, ගම්පහ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයේ හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයේ, හා ගම්පහ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයේ වැඩ බැලීමට.

අංකය : ජේඑස් සී/පී.පී 2/56 (III).

කේ. වී. සවර්නාධිපති මහතා 1962 ජූලි 20 වැනි දින් සිට නැවත නියමයක් කරන තුරු, මාතර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මාතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 63ඒ/58.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. ජී. ද සිල්වා මහතා 1962 ජූලි 21 වැනි දින, අවිස්සාවේල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අවිස්සාවේල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරය.

අංකය : ජේඑල්. 23ඒ/58.

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. ඒ. ඊ. මීගම මහතා 1962 ජූලි 27 වැනි දින සිට 31 වැනි දින දක්වා, පානදුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා පානදුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 1සී/53.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. මතවරාජා මහතා 1962 ජූලි 22 වැනි හා 23 වැනි දිනයන්හි, ත්‍රිකුණාමලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, අනුරාධපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා අනුරාධපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 51ඒ/54.

ටී. ජේ. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එච්. උඩලාගම මහතා 1962 ජූලි 25 වැනි දින සිට 29 වැනි දින දක්වා කෑගල්ලෙ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා කෑගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 17සී/62.

ජේ. ජේ. එෆ්. ඒ. ඩයස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. එම්. ගුරුසාමි මහතා 1962 ජූලි 25 වැනි දින, මහනුවර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, දුම්බර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ. එල්. 57ඒ/57.

කේ. ඩී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. බී. යටවර මහතා 1962 ජූලි 21 වැනි සිට 24 වැනි දින දක්වා, ගම්පොල පිහිටි උසාවියේ ක්‍රියා කරන පිණිස, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා ගම්පොල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 68සී/51.

සී. වී. උඳලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. ජයවික්‍රම මහතා 1962 ජූලි 28 වැනි දින සිට 30 වැනි දින දක්වා හා 1962 අගෝස්තු 9 වැනි දින සිට 12 වැනි දින දක්වා, අනුරාධපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, ත්‍රිකුණාමලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ත්‍රිකුණාමලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 37ඒ/55.

පී. මාරපන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එච්. උඳලාගම මහතා 1962 අගෝස්තු 3 වැනි දින, කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා කෑගල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 16ඒ/59.

ඩී. ඊ. ධර්මසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එල්. ද සිල්වා මහතා 1962 ජූලි 26 වැනි දින, බලපිටියේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට හා බලපිටියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 1ඒ/48.

පී. එස්. ඩබ්ලිව්. අබේවර්ධන මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, වී. එම්. ගුරුසාමි මහතා 1962 අගෝස්තු 29 වැනි දින සිට, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මහනුවර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 8බී/57.

බී. ඊ. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. එන්. බර්තෝලමියුස් මහතා 1962 ජූලි 24 වැනි දින සිට 27 වැනි දින දක්වා, නුවරඑළියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා බදුල්ල-හල්දුම්මුල්ල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 7ඒ/51.

ඒ. ඕ. එස්. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, බී. ආර්. ජී. විජයකෝන් මහතා 1962 ජූලි 28 වැනි දින සිට 30 වැනි දින දක්වා, මාතලේ පිහිටි උසාවියේ ක්‍රියා කරන පිණිස, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මාතලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේ.එල්. 3ඒ/59.

ඒ. එම්. අමීන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. වී. එස්. ද සිල්වා මහතා 1962 අගෝස්තු 2 වැනි දින සිට 4 වැනි දින දක්වා (කුලියාපිටියේ පළාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල), කනදුල්ලේ පිහිටි උසාවියේ ක්‍රියා කරන පිණිස, කුරුණෑගල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා (කුලියාපිටියේ පළාත් ආණ්ඩු සභාව පිහිටි සීමාව තුල) කනදුල්ලේ පිහිටි උසාවියේ ක්‍රියා කරන පිණිස, කුරුණෑගල, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 52/48.

එන්. එම්. ජේ. රාජේන්ද්‍රම්, සී. බී. වල්ගම්පාය සහ එස් ජේ. එම්. ජී. එස්. මුදන්නායක යන මහතුන් නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. ජේ. කේ. ගුණතිලක මහතා 1962 ජූලි 25 වැනි දින, කළුතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා කළුතර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : පිඑල්/කේ. 4/48.

කේ. අයි. කරුණාරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එෆ්. එච්. ද අල්විස් මහතා 1962 ජූලි 19 වැනි දින සිට 21 වැනි දින දක්වා හා 23 වැනි හා 24 වැනි දිනයන්හි, ගාලු දිස්ත්‍රික්කයේ, කඩවත් සතරේ හා තල්පේ පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පිඑල්/ඩබ්ලිව්. 10/53.

එම්. එම්. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. බී. රත්නායක මහතා 1962 ජූලි 25 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ හා වන්නි හත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ හා ගිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පිඑල්/කේ. 1/48.

එම්. බී. කප්පාගොඩ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. එම්. සී. රත්නායක මහතා 1962 ජූලි 19 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ, පාත දුම්බර හා උඩ දුම්බර ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පිඑල්/එස්. 13/61.

එම්. ජේ. පී. සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. ඒ. ඩබ්ලිව්. වික්‍රමසූරිය මහතා 1962 ජූලි 19 වැනි හා 20 වැනි දිනයන්හි, තංගල්ල දිස්ත්‍රික්කයේ, බටහිර ගිරුවා පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පිඑල්/ආර්. 4/50.

එස්. පී. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එහෙම්පරම් මහතා 1962 ජූලි 30 වැනි දින හා 1962 අගෝස්තු 1 වැනි දින සිට 3 වැනි දින දක්වා, යාපන දිස්ත්‍රික්කයේ, දූපත් හා බටහිර වලිකාමම් ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 ජූලි 26 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය—573,
කොළඹ 12.

8-130

---

# වෙනත් පත් කිරීම් ආදිය

**1962 අංක 317**

මගේ අංකය : ඒජේ. 10/2/55

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

1. එස්. එම්. ඩී. ඩබ්ලිව්. ජයතිලක මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,
2. ටිකිරිබණ්ඩා යටිවැල්ල මහතා නුවරඑළිය අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,
3. එම්. ඒ. ජිනදාස මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,
4. එම්. ආර්. එම්. කිරිබණ්ඩා මහතා බදුලු අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද

පත් කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
ස්ථිර ලේකම්.

1962, ජූලි මස 27 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-231

---

**1962 අංක 318**

අංකය : ඩී. 178/රෙක්ට්.

## රාජකීය ලංකා නාවික හමුදාව—නිලධාරීන් ස්ථිර කිරීම්

පහත සඳහන් නිලධාරියා 1960 ජූලි 1 වැනි දින සිට උප ලයිතන් (ඉ) පදවියේ ස්ථිර කරන ලදී :—

වැඩ බලන උප ලයිතන් (ඉ) ඩී. සී. ඩී. ලේකම්වසම්, රාජකීය ලංකා නාවික හමුදාව.

ඇන්. කූ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 ජූලි 16 වෙනිදා,
කොළඹ දීය.

8-1

**1962 අංක 319**

ලංකා සිවිල් සේවාවේ පහත සඳහන් පත්වීම් පහත දක්වා ඇති දිනවල පටන් වලංගු වේ :—

අංකය : 74/2/37 (ඇම් ඇෆ්ජ්).

බී. සී. පෙරේරා මහතා 1962 ජූලි මස 2 වැනි දින සිට නැවත නියම යක් කරන තුරු මහා භාණ්ඩාගාරයේ ආයතන පාලකයෙකු වශයෙන් වැඩ බැලීමට.

අංකය : 74/2/99 (ඇම් ඇෆ්ජ්).

පී. ජී. පුංචිහේවා මහතා 1962 ජූලි මස 2 වැනි දින සිට කලුතර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැනගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ උප ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

අංක : 74/24/17 (ඇම් ඇෆ්ජ්).

ආධුනික සිවිල් සේවක එස්. එම්. එල්. මරික්කාර් මහතා 1962 ජූලි මස 2 වැනි දින සිට මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

ආධුනික සිවිල් සේවක එස්. එල්. බී. අඹුළුගම මහතා 1962 ජූලි මස, 2 වැනි දින සිට මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

ආධුනික සිවිල් සේවක බී. ඇස්. විජේවීර මහතා 1962 ජූලි මස 2 වැනි දින සිට මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

ආධුනික සිවිල් සේවක එල්. එල්. බී. අයි. ගුණතුංග මහතා 1962 ජූලි මස 2 වැනි දින සිට මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

ආධුනික සිවිල් සේවක බී. ජී. පී. සෙනෙවිරත්න මහතා 1962 ජූලි මස 2 වැනි දින සිට මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

ආධුනික සිවිල් සේවක ආර්. ජී. ගෝමස් මහතා 1962 ජූලි මය 2 වැනි දින සිට මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

ආධුනික සිවිල් සේවක පී. ඒ. ඩී. ගුණසිංහ මහතා 1962 ජූලි මස 2 වැනි දින සිට මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

ආධුනික සිවිල් සේවක එම්. බී. දිසානායක මහතා 1962 ජූලි මස 2 වැනි දින සිට මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

අංක : 74/48 (ඇම් ඇෆ්ජ්).

ආධුනික සිවිල් සේවක බී. එස්. විජේවීර මහතා 1962 ජූලි මස 9 වැනි දින සිට ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටීමට.

ආධුනික සිවිල් සේවක එල්. එල් බී. අයි. ගුණතුංග මහතා 1962 ජූලි මස 9 වැනි දින සිට ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටීමට.

ආධුනික සිවිල් සේවක එච්. බී. දිසානායක මහතා 1962 ජූලි මස 9 වැනි දින සිට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටීමට.

අංකය : 74/2/210 (ඇම් ඇෆ්ජ්).

ඒ. බී. සමරජීව මහතා 1962 මැයි මස 8 වැනි දින සිට 1962 මැයි මස 14 වැනි දින් දක්වා මහා භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

හ. ෂ. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

මුදල් අමාත්‍යාංශය,
කොළඹ,
1962 ජූලි මස 23 වැනි දින.

8-2

**1962 අංක 320**

අංක 4/1/16 (ඇම්. ඇෆ්ජ්/ජී. සී.)

1962 ජූලි මස 16 වැනි දින සිට එස්. සෙල්වජයම් මහතා විදේශ නිවාඩුවක් ගත කරන කාලය තුලදී මුදල් බදු තක්සේරුකරු පී සී. ගුණවර්ධන මහතා ඔහුගේ රාජකාර්‍යයන්ට අතිරේක වශයෙන් දේශීය ආදායම් විවේචන මණ්ඩලයේ ලිපිකාර තැන වශයෙන් ගරු මුදල් ඇමතිතුමා විසින් ආදායම් බදු ආඥපනතේ 74(2) වැනි වගන්තිය යටතේ පත් කර තිබේ.

හ. පණ්ඩිත ගුණවර්ධන,
මුදල් අමාත්‍යාංශයේ සථිර ලේකම් වෙනුවට.

මුදල් අමාත්‍යාංශය,
1962 ජූලි මස 28 වැනි දින,
කොළඹ දී ය.

8-180

**1962 අංක 321**

## ඉඩම් සංවර්ධන ආඥපණත (320 වැනි පරිච්ඡේදය)

ඉඩම් සංවර්ධන ආඥපණතේ 6 (1) වෙනි ඡේදය යටතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ගරු ඇමතිතුමා විසින් තාවකාලික ඉඩම් නිලධාරි බී. කේ. ඇහැළපොල මහතා ඔහුගේ රාජකාරිවලට අතිරේකව මුළු දිවයිනේම ඉඩම් නිලධාරියෙක් වශයෙන් වර්ෂ 1962 ක්වූ අගෝස්තු මස 1 වෙනි දින සිට පත්කොට තිබේ.

සී. ජී. එල්. මීසෝ,
සථාවර ලේකම්.

කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල
ඇමති කාර්යාලය,
කොළඹ, 1962.7.19.

8-4

## ආණ්ඩුවේ නිවේදන

අ.ආ.කා. අංකය : ඕ. 103.

මහනුවර දේවස්ථාන ආඥපනතේ (330 වන අධිකාරයේ) 5 වෙනි වගන්තිය යටතේ, අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, ඕ.බී.ඊ., නාමධාරී, දොස්තර වී. එච්. එල්. ඇන්තනිස්, මුදලිඳු ඒ. ඒ. ද අල්විස් සහ ආචාර්ය ඒ. වී. රිචඩ්ස් යන මහත්වරුන් මහනුවර ශාන්ත පාවුළුගේ දේවස්ථානයේ භාරකරුවන් වශයෙන්ද, එකී ආඥපණතේ 17 වෙනි වගන්තිය යටතේ, ඇෆ්ජ්.බී.අයි. (ලන්ඩන්) උපාධිධාරී, පී. මුත්තයියා මහතා, එම දේවස්ථානයේ ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම පවත්වනතුරු ගණන් පරීක්ෂා කිරීමට ද පත් කරන්නට යෙදුණු බව, මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,
ඇස්. ජේ. වල්පිට,
අග්‍රාණ්ඩුකාරතුමාගේ වැඩබලනලේකම්.

1962 ජූලි 25 වැනි දින,
කොළඹ අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේදී.

8-118

අංකය : 965/15/128 (එස්බී/ඊපී).

ඇල්. සී.—බී 28/61

### 1961 අංක 19 දරණ නැව් නැගීමේ බදු පනත

**නිවේදනය**

### මුද්‍රණ දෝෂ නිවැරදි කිරීම

1961 අංක 19 දරන නැව් නැගීමේ බදු පනතෙහි 11 වෙනි වගන්තිය යටතේ මුදල් ඇමතිවරයා විසින් පනවනු ලැබ, අංක 13,162 හා 1962 ජූනි 8 වෙනි දින දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නියෝගවල—

1. (ඒ) නියෝගය

"(ඒ) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ විසින් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ පාලනය කරනු ලබන කිසියම් ගුවන් තොටුපළකින් ලංකාවෙන් පිටව යන්නා වූ කිසිදු පුද්ගලයකු"

යනුවෙන් සදොස් ලෙස මුද්‍රණය කොට ඇති බවත් ; එය

"(ඒ) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ විසින් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ පාලනය නොකරනු ලබන කිසියම් ගුවන් තොටුපළකින් ලංකාවෙන් පිටව යන්නා වූ කිසිදු පුද්ගලයකු"

යනුවෙන් නිදොස් විය යුතු බවත්

මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

හ. ෂ. අමරසිංහ,
මුදල් අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 ජූලි මස 20 වෙනි දින,
කොළඹ දී ය.

8-193

## 1958 අංක 1 දරණ කුඹුරු පනත

1958 අංක 1 දරණ කුඹුරු පනත යටතේ ඉදිරිපත් කෙරෙන ඇපැල් පෙත්සම් විභාග කිරීම හා තීරණය කිරීම සඳහා එම පනතේ 59 (1) වගන්තියේ හා පනත යටතේ සකස් වී ඇති රෙගුලාසිවල විධිවිධාන අනුව පිහිටුවා ඇති සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් 1962.8.15 වැනි දින සිට අවුරුද්දක කාලයක් සේවය කිරීම පිණිස පහත නම් සඳහන් අය ගරු කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබලය පිළිබඳ ඇමැති තුමා විසින් පත් කර ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇස්. සෝමසිංහ මහතා

ඇම්. ශ්‍රීකාන්ත,
අතිරේක නිත්‍ය ලේකම්.

කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබලය පිළිබඳ අමාත්‍යාංශය,
1962.7.24,
කොළඹ දීය.

8-73

---

## 1954 අංක 37 දරන ජාතික නිවාස පනත—49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරන ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතේහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

1962 ජූලි මස 23 වැනි දින දීය.
කොළඹ 2.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ, නැගෙනහිර කළුබෝවිල ගම්මුලාදෑනි වසමේ පිහිටි වැල්ලබඩගෙවත්ත නැමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති පර්චස් 17.10ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක්:—
උතුරට : එම ඉඩමේ කොටසක් ; නැගෙනහිරට : අඩි 12ක් පළලැති පාරක් සඳහා වෙන් කර ඇති ඉඩම් කොටස ; දකුණට : නාලන්දාරාම පාර ; බස්නාහිරට : පල්ලිය පාරේ වරිපනම් අංක 42 දරන ඉඩම.

8-91

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ටයර් හා ටියුබ් සැපයීම—1962-63

පහත දැක්වෙන කරුණු අනුව සම්පූර්ණ විස්තර ඇතුළු තමන්ගේ අළුත්ම මිළ ලැයිස්තු අනුපිටපතින් ඉදිරිපත් කරන ලෙස, මෝටර් රථ, මෝටර් සයිකල්, මෝටර් ට්‍රක් රථ සහ ලොරි, ට්‍රැක්ටර්, ට්‍රේලර් රථ, කුණු බාහනයන්, සතුන් විසින් අදිනු ලබන වාහන හා ගුවන් නැව් ආදිය සඳහා ටයර් හා ටියුබ් මෙරටට ගෙන්වන්නන්ගෙන් මෙයින් ඉල්ලා සිටිනු ලැබේ :—

(i) තම තමන් විසින් පුරුදු පරිදි මෙරටට ගෙන්වා තොග කර ඇති ටයර් හා ටියුබ්වල ප්‍රමාණයන්.

(ii) රජයේ ඇණවුම් උදෙසා තමන්ගේ ලැයිස්තු මිළ වලින් අඩු කළ හැකි වැඩිම වට්ටම.

2. පහත දක්වා ඇති පරිදි සවිස්තර සහිතව ටයර් හා ටියුබ්වල තීරු ගාස්තු නොගෙවූ මිළ ලැයිස්තු අනුපිටපතින් සපයන ලෙසද මෙරටට බඩු ගෙන්වන්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ :—

(ඒ) තීරු ගාස්තුවලින් තොරවූ මිළ පදනමක් උඩ පිටරටින් ගෙන්වා සැපයිය හැකි ටයර් හා ටියුබ්වල ප්‍රමාණයන්,

(බී) ආණ්ඩුවේ ඇණවුම් උදෙසා තීරු බදු තොරවූ මිළෙන් අඩුකළ හැකි වැඩිම වට්ටම,

(සී) රජයේ ඇණවුම් සම්බන්ධයෙන් තීරු බදු නොගෙවූ පදනම උඩ මෙරටට ගෙන්වා සැපයීමට ගතවෙන කාලය.

3. කොළඹ නාගරික සීමාවෙන් ඇතුළත බඩු ගෙනැවිත් භාරදීමට හෝ කොළඹින් බැහැර ස්ථානයන්ට යැවීමේදී ළගම ඇති දුම්රිය ස්ථානයට/දුම්රිය බඩු ගුදමට භාරදීම සඳහා දැරීමට සිදුවන සෑම වියදමක්ම තීරු බදු නොගෙවූ මිළට ඇතුලත් විය යුතු බව සැළකිය යුතුය.

4. තමා ලඟ ඇති තොගවලින් කෙරෙන සැපයීම්වලට හා තීරු බදු වලින් නිදහස්ව මෙරටට ගෙන්වා කෙරෙන සැපයීම් සම්බන්ධයෙන් පිළිවෙලින්, කොළඹින් බැහැර ස්ථානයන්ට යැවීමේදී දැරීමට සිදුවන දුම්රිය ප්‍රවාහන ගාස්තුව තමා විසින්ම දරණු ඇත්දැයි යන්න පැහැදිලිවම දැක්විය යුතුය.

5. මිළ ලැයිස්තු සහ අනිකුත් විස්තර අනුපිටපතින්, 1962 සැප්තැම්බර් 4 වෙනි දින පූ. භා. 9.30 ට ප්‍රථම කොළඹ, තැ. පෙ. අංක 500, මුදල් අමාත්‍යාංශ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ඉදිරිපත් කළ යුතුය.

"ටයර් සහ ටියුබ් සඳහා ටැන්ඩර්" යන්න ලියුම් පිට කවරයෙහි සඳහන් කළ යුතුය.

එස්. ඒ. පී. රූපසිංහ,
වැඩබලන ගබඩා අධිකාරී.

කොළඹ,
1962 අගෝස්තු 3 වැනි දින.

8-218

---

ඇල්.ඩී—බී. 98/35.

## 1950 සමුපකාර සමිති ව්‍යවස්ථා-නිවේදනය

1950 මාර්තු 24 වෙනි දින අංක 10,086 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1950 සමුපකාර සමිති ව්‍යවස්ථාවන්හි 38 (12) ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ත්‍රාර් තැන්පත් තිලක් එරංග ගුණරත්න වන මම, ප්‍රදානයකට විරුඬව ආයාචනා කරන විට රෙජිස්ත්‍රාර්වරයාට යැවිය යුතු මුදල් ප්‍රමාණය ගණන් බලා ගන්නා ක්‍රමය පහත සඳහන් ලෙස විය යුතු යයි මෙයින් නියම කරමි :—

(අ) ආයාචනය යම්කිසි මුදලක් ගෙවන ලෙස කරන ලද ආඥාවකට විරුඬව නම්, උපරිම මුදල වශයෙන් රුපියල් දෙසීයකට (රු. 200) යටත්ව රුපියල් දහයෙ (රු. 10) නුත් ගෙවන්ට නියම වූ මුදලින් සියයට දහය (10%) කට සමාන මුදලිනුත්, වඩා වැඩි මුදල,

(ආ) ආයාචනය යම්කිසි මුදලක් ඉල්ලමින් කරන ලද ඉල්ලීමක් ඉවත දැමීමකට විරුඬව නම්, උපරිම මුදල වශයෙන් රුපියල් දෙසීයකට (රු. 200) යටත්ව රුපියල් දහයෙ (රු. 10)නුත් ආයාචනයෙන් ඉල්ලනු ලබන මුදලින් සියයට දහය (10%) කට සමාන මුදලිනුත්, වඩා වැඩි මුදල.

ටී. ඊ. ගුණරත්න,
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා
සමුපකාර සමිති රෙජිස්ත්‍රාර්.

1962 ජූලි 26 දින,
කොළඹ, තැ. පෙ. 419,
සමුපකාර දෙපාර්තමේන්තුවේ දීය.

8-119

---

## වන සත්ව හා දුර්ලභ වෘක්ෂලතා ආඥාපනතේ 469 වැනි පරිච්ඡේදයේ 13 (1) දරණ වගන්තිය යටතේ කරන ප්‍රකාශනයයි

අනුරාධපුර දිසාපති හා අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් වන සත්ව භාරකරු වන නිශ්ශංක පරාක්‍රම විජේරත්න නමැති මා වන සත්ව හා දුර්ලභ වෘක්ෂලතා ආරක්ෂක පනතේ 13 (1) වගන්තියේ ප්‍රකාර පහත සඳහන් කරන ප්‍රදේශය අලින්ගෙන් හානි සිදුවන ප්‍රදේශයක් වශයෙන් ශංකා කරනු ලැබේ.

2. පහත නියම කරනලද ප්‍රදේශය ඇතුළතදී සුදුසු යයි හැඟෙන හෝ අවස්ථානුකූල කොන්දේසි මත නිදහස් හෝ නියමිත ගාස්තු වක් මත හෝ මා විසින් ප්‍රමාණවත් යයි සළකන නියමිත ගාස්තුවට නොවැඩි ගාස්තුවක් මත හෝ දඩයම් කිරීමට වෙඩිතැබීමට මැරීමට හෝ ඇල්ලීමට බලපත්‍රලාභියාට බලය පවරා බලපත්‍ර අපේක්ෂකයනට බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

### නියම කරන ප්‍රදේශය

3. අලියා සාමාන්‍යයෙන් හැසිරෙන ප්‍රදේශ පහත දැක්වේ.

නුවර ගම් පළාත-නැගෙනහිර-ප්‍රදේශීය ආදායම් පාලක තුමාගේ කොට්ඨාශයේ 16 ඒ ගම්මුලාදෑනි කොට්ඨාශය.

කුඩා කුඹුක් ගොල්ලෑව
එරඹ කුළම
බලන් කඩවල
**යකවැව**
පෙරියකුළම සහ කටු කැලියාව

**අලියා පිළිබඳ විස්තර**

ස්ත්‍රී පුරුෂ බව : පුරුෂ.

උස : උරහිස දක්වා උස අඩි අටක් පමණ.

හොඬ වැලේ සහ නලලේ කබර පැල්ලම් ඇත.

අලි ගණන : 1 යි.

4. වැඩි විස්තර අනුරාධපුර දිසාපති කාර්යාලයෙන් ලබා ගත හැකිය.

5. දැන්වීම 1962.7.6 දින සිට මාස 2 ක් වලංගුය.

ඇන්. සී. විජේරත්න,
අනුරාධපුර දිසාපති තැන හා
දිස්ත්‍රික් වන සත්ව භාරකරු.

දිසාපති කාර්යාලය,
අනුරාධපුරය,
1962.7.5.

8-26

---

## ප්‍රකාශනයයි

වයඹ පළාතේ හලාවත දිස්ත්‍රික්කයේ ඉහළගම සහ උරලිය ආර ගම්පති කොට්ඨාශවල ගවයන් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට : කරුක්කුව සහ පඹල ගම්පති කොට්ඨාශ ; දකුණට : තිනිපිටිය වැව ජලාශය ; නැගෙනහිරට : කුදිරිප්පුව සහ කරුක්කුවටවන ගම්පති කොට්ඨාශ ; බස්නාහිරට : මොරන් බාතිය සහ ලුනු ඔය කලපුව.

2. මෙම ආඥ පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගව යන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර හලාවත පශු වෛද්‍ය තැනගෙන් හෝ පිටිගල් කෝරළේ උතුර කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායඹාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දත්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 ජූලි 25 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කායඹාලයේදීය.

8-157

---

## ප්‍රකාශනයයි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නුගගහගෙදර ගම්පති කොට්ඨාශයේ නුගගහගෙදර ගමේ ගවයන් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආරියදාස අමරසිංහ වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට : පහමුන, කරගහ ගෙදර පාර ; දකුණට : කඩහපොළ පන්සල් මාවත ; නැගෙනහිරට : නුගගහගෙදර, ගිනිගත්පිටිය අතර මායිම ; බස්නාහිරට : කඩහපොළ-කටුපොත පාර.

2. මෙම ආඥපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්තකරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර පොල්ගහවෙල පශු වෛද්‍ය තැනගේ හෝ දඹදෙණි හත්පත්තු කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දත්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 ජූලි 5 වැනි දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කාර්යාලයේදී ය.

8-88

---

## ප්‍රකාශනයයි

බටහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ මීගමු නගර සීමා ඇතුළත ගවයන් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : මීගමු-පුත්තලම් ඇලේ කොටසක් සහ කනත්ත පාර ; දකුණට : දිය හොඳ ඇල ; නැගෙනහිරට : දළුපොත ඇල සහ දියහොඳ ඇලේ කොටසක් ; බස්ණාහිරට : මුහුද සහ කලපුව.

2. මෙම ආඥපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්තකරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර මීගමුවේ පශු වෛද්‍ය තැනගෙන් හෝ අළුත්කුරු කෝරළේ උතුර කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායඹාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතු යි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 ජූලි 28 වැනි දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කායඹාලයේදී ය.

8-187

---

## දැන්වීමයි

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිට බටහිර කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ හොඬගම, කටුවිල සහ නාපේ ගම්වල ගවයින් අතර, "රක්තාශ්‍රව (හෙමරජික් සෙප්ටිසීමියා)" නමැති රෝගය පැතිරී යන බැවි 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥ පනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වෂී 1962 ජූනි 15 දින අංක 13,168 හා 1962 ජූලි 13 දින අංක 13,206 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රවල ප්‍රසිද්ධ කරන ලද, දැන්වීම් අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1962 ජූලි 24 වැනි දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
කායඹාලයේදී ය.

8-68

## දැන්වීමයි

උතුරු මැද පලාතේ පොළොන්නරු දිස්ත්‍රික්කයේ තමන්කඩුව කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ සිංහල පත්තුවේ ගම්පති කොට්ඨාශයේ ගවයින් අතර, "රක්තාශ්‍රව (හෙමරජික් සෙප්ටිසිමියා)" නමැති රෝගය පැතිරී යන බැවි 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 පරිච්ඡෙදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වඹී 1962 ජූලි 1 දින අංක 13,145 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද, දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1962 ජූලි 24 වැනි දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
කාර්‍යාලයේදී ය.

8-72

---

## 27.9.62 සිට 4.10.62 දින දක්වා රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව වසා තැබීම

ගණන් පියවීම සඳහා 1962 සැප්තැම්බර් මස 27 වැනි දින සිට 1962 ඔක්තෝබර් මස 4 වෙනි දින (දෙදිනම ඇතුලත්ව) දක්වා ආණ්ඩුවේ ගබඩා දෙපාර්තමේන්තුවෙන් භාණ්ඩ නිකුත් කිරීම නවත්වනු ඇත.

1949.7.1 දින අංක 962/7/138 (සී. ඊ. ඇස්/බී) 218 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛනයේ විස්තර කෙරෙන හදිසි අවශ්‍යතාවයක් සඳහා නොවේ නම් 1962 අගෝස්තු 31 වැනිදායින් පසු 1961/62 මුදල් වර්ෂය යටතේ බඩු ඉල්ලුම් පත් භාර නොගන්නා බැවි දෙපාර්තමේන්තු ප්‍රධානීන් කරුණාවෙන් සලකත්වා.

ඇස්. ඒ. පී. රූපසිංහ,
වැඩ බලන ගබඩා අධිකාරි.

1962 ජූලි මස 25 වැනි දින,
කොළඹ,
ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ දීය.

8-100

---

## දළුගම-කැළණිය මාර්ගයේ අංක 1/1 දරන බෝක්කුව

### උතුරු කොළඹ ප්‍රදේශය

ඉහත සඳහන් බෝක්කුවේ වැඩ, දැන් අවසන්කර, මාර්ගය රථවාහන ගමනාගමනය සඳහා විවෘතකර තිබේ.

මෙල්සන් ප්‍රනාන්දු,
ආණ්ඩුවේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

27. 7. 1962,
කොළඹ රජයේ වැඩ කාර්යාලයේ දීය.

8-127

---

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3. 30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

**1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද, සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

**5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක් පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.**

**6. ප්‍රමාදය සහ දොස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.**

**7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

**8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලබේ.**

**9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ** පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. 1962 ජූලි මස 16 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරණ ගාස්තු මෙසේ යි :—

| | රු. | ශ. |
|---|---|---|
| **අඟලකට හෝ ඉන් අඩුව** ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 10 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 110 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 220 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

**11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**12. ගැසට් පත්‍රය පළ කරණ දින සිට කාර්යාලය වැඩ කරණ දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි. (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).**

**13. දායක ගාස්තු :—**

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | ශ. | | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|---|
| එක්කොටසක් ... ... .... | 22 | 50 | ... | 35 | 50 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 12 | 50 | ... | 18 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 20 | 0 | ... | 28 | 0 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුලැබේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. | ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. | ශ. |
|---|---|---|---|---|---|
| **(අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී එක කොටසක්** ... | 0 | 25 | ... | 0 | 20 |
| **ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක්** ... | 0 | 50 | ... | 0 | 20 |
| **(ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී, 1 වැනි කොටසේ එක් ඡේදයක්** ... | 0 | 10 | ... | 0 | 15 |
| **ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු I වැනි කොටසේ එක ඡේදයක්** ... ... | 0 | 20 | ... | 0 | 15 |

**දායක මුදල් භාරගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි